# 3 ශ්‍රේණිය - සිංහල - පැවරුම 2

**1. ඡේදය කියවන්න.**

අපි දිනපතා ප්‍රවෘත්ති බලන්න පුරුදුවන්න ඕනෑ. එතකොට අපිට විවිධ තොරතුරු දැනගන්න පුළුවන්. රට තොට පුවත් දැන ගැනීම හරිම වටිනවා. රථ වාහන ගැන, වනය ගැන ,ගංගා ඇළ දොළ ගැන, දැන ගන්න අපට එතකොට පුළුවන්.

ලංකාව වටේටම මුහුද. අපේ රටේ ඇතුලේ මොන තරම් දේවල් තිබෙනවාද. ගංගා, ඇළ, දොළ, වනාන්තර වගේම ඇස් අදහා ගත නොහැකි අලංකාර දිය ඇලිත් තිබෙනවා.

ඒ වගේම රෑ දවල් අපට සෙවන සළසන ගස් වැල් කරන්නේ පුදුම සේවාවක්. ගස්වැල් සහිත වනය මෙන්ම ඇළ, දොළ, ගංගා, දියඇලි ආරක්ෂා කර ගැනීමට දිවා රාත්‍රී වෙහෙස වෙමු. එවිට අපටත් සතුටින් ජීවත් වීමට හැකි වේවී.

**සමානාර්ථ පද ඡේදයෙන් තෝරා ලියන්න.**

1. දිවයින - ______________________
2. නෙත් - ______________________
3. කැලෑව - ______________________
4. රිය - ______________________
5. ප්‍රවෘත්ති - ______________________

**2. කතන්දරය හොඳින් කීප වරක් කියවන්න. ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**අග මුල සෙවූ හැටි**



ඈත අතීතයේ දඹදිව මියුලු නුවර වේදේහ නම් රජෙක් රජකම් කළේ ය. මියුලු නුවර ප්‍රධාන ගම හතරක් විය. යවමැදුම්ගම ඉන් එකකි. ඒ ගමේ නායක සිටුතුමා සිරිවඩ්ඪන නම් විය. ඔහුගේ බිරිය සුමනා දේවිය යි. ඔවුනට නුවණැති පුත් කුමරෙකු විය.

ඔහු මහෞෂධ නමින් හැඳින්විණි. ඔහුගේ නුවණැති බව මියුලු නුවර පුරා කතා බහට ලක්විය. වේදේහ රජතුමාට ද මේ තොරතුර දැන ගන්නට ලැබිණි.

රජතුමා මහෞෂධගේ නුවණ පරීක්ෂා කිරීමට සිතී ය. ඔහු වරින් වර ඒ සඳහා යවමැදුම්ගම වැසියන්ට ගැටලු යොමු කළේ ය.

දිනක් රජතුමා අගමුල සමාන කිහිරි දණ්ඩක් ගම වැසියන්ට එව්වේ ය. ඒ අග මුල සලකුණු කිරීමට යි. එය නිවැරදිව කළ නොහැකි වුවහොත් දහසක දඩයක් ගෙවීමට සිදු වන බව දන්වා තිබිණි.

ගම්වැසියෝ ඉක්මනින් සිරිවඩ්ඪන සිටුතුමා හමු වූහ.

කාරණය කුමක් දැයි සිරිවඩ්ඪන සිටුතුමා ගම්වැසියන්ගෙන් විමසුවේ ය.

"සිටුතුමනි, අපට අනුකම්පා කරනු මැනවි. මේ කිහිරි දණ්ඩෙහි අග මුල දැන ගැනීමට වුවමනා ය. එය රාජ නියෝගයකි. නැතහොත් දහසක දඩයකට යටත් වීමට සිදු වනු ඇත. නුවණැති මහෞෂධ කුමරු ලවා මීට විසඳුමක් ලබා දෙනු මැනවි." ඔවුහු ඉල්ලා සිටියහ.

සිටුතුමා මහෞෂධ කුමරු කැඳවීය ය. ගැමියෝ කුමරුට කිහිරි දණ්ඩ පෙන්වා "මෙහි අග මුල සොයා ගැනීමට උපකාර කරන්න" යි ඉල්ලූහ.

"රජතුමාට කිහිරි දණ්ඩෙහි අගින් හෝ මුලින් හෝ කිසිදු ප්‍රයෝජනයක් නැත. මේ මාගේ නුවණ පරීක්ෂා කිරීමේ වෑයමක් විය හැකි ය" මහෞෂධ කුමරු සිතීය.

"මේ ගැටලුව මම විසඳමි" කුමරු ගම්වැසියන්ට කිය. ඉන් අනතුරුව ඔහු කිහිරි දණ්ඩ අතට ගෙන හොඳින් පරීක්ෂා කළේ ය. පැන් බඳුනක් හා ලණුවක් ගෙන එන ලෙස දැන්වූයේ ය.

කුමරු, ලණුව කිහිරි දණ්ඩේ මැදින් ගැට ගැසී ය. ලණුවේ කෙළවර අල්ලා ගෙන කිහිරි දණ්ඩ පැන් බඳුනේ ගිල්වී ය.

කිහිරි දණ්ඩේ මුල පැත්ත බර වැඩි බැවින් පළමු ව දියේ ගිලිණි. කුමරු ගම්වැසියන්ගෙන් මෙසේ විමසී ය.

"බරෙන් වැඩි වන්නේ ගසක මුල කොටස ද? අග කොටස ද?"

"කුමරුනි මුල කොටස බරින් වැඩි" යැයි ගම්වැසියෝ මහා හඬින් ප්‍රකාශ කළහ. ඉන් පසුව මහෞෂධ කුමරු "එසේ නම් දණ්ඩෙහි පළමුව දියේ ගිලුණු කොටස මුලයි අනෙක් කොටස අගයි" යනුවෙන් පැවසී ය.

මහෞෂධ කුමරු කිහිරි දණ්ඩ පිළිබඳ ව ප්‍රශ්නය විසඳූ ආකාරය පිළිබඳ ව ගම්වැසියෝ මහත් සතුටට පත්වූහ.

රජතුමා ද මහෞෂධ කුමරුට ප්‍රශංසා කොට තෑගි ද ලබා දුන්නේය. ඔහු වේදේහ රජතුමාගේ සේවයට එක්වී බොහෝ ගැටලු විසඳී ය. පසු කලෙක මහෞෂධ පඬිතුමා ලෙස ප්‍රකට විය.

හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

1. මියුලු නුවර ප්‍රධාන ගම අටක් විය ( )
2. යවමැදුම්ගම මියුලු නුවර තිබූ ගමකි. ( )
3. යවමැදුම්ගම නායක සිටුතුමා ජයවර්ධන නම් විය. ( )
4. නායක සිටුතුමාගේ පුතා කෞශල්‍ය විය. ( )
5. රජතුමා අග මුල සමාන කිහිරි දණ්ඩක් ගම්වැසියන්ට එව්වේ ය. ( )
6. ගසක මුල කොටසේ බර අඩුය. ( )
7. රජතුමා මහෞෂධ කුමරුට ප්‍රශංසා කළේ ය. ( )
8. මහෞෂධ පඬිතුමා වේදේහ රජතුමාගේ සේවයට එක් විය. ( )

**3. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළු හා ඒවායේ තේරුම හොඳින් කියවා අවබෝධ කරගන්න.**

1. **ළිඳේ ඉන්න ගෙම්බා වගේ -**
   තමා අවට සමාජය පිළිබඳ ව අවබෝධයක් නොමැති ව සිටීම.
2. **ඉඳි කටුවයි නූලයි වගේ -**
   සැමවිටම තමන් සමග තවත් අයෙක් එකට සිටීම.
3. **මඬේ හිටවපු ඉන්න වගේ -**
   එක තීරණයක නොසිටීම.
4. **ඉබ්බගෙන් පිහාටු ගන්නවා වගෙයි -**
   කෙනෙකුගෙන් කෙසේවත් ලබා ගත නොහැකි දෙයක් ලබාගැනීම උස්සහා දැරීම.
5. **පරංගියා කෝට්ටේ ගියා වගේ -**
   කිට්ටු පාරක් තිබිය දී දුර පාරකින් යාම.

**හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

1. පරංගියා ______________________ ගියා වගේ
2. ______________________ හිටවපු ඉන්න වගේ
3. ඉබ්බාගෙන් ______________________ ඉල්ලනවා වගේ
4. ළිඳේ ඉන්න ______________________ වගේ
5. ______________________ නූලයි වගේ.

| |
|---|
| ගෙම්බා / පිහාටු/ මඬේ/ කෝට්ටේ/ ඉඳිකටුවයි |

4. **පහත දැක්වෙන ප්‍රවෘත්ති ප්‍රකාශය හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න**

**ප්‍රවෘත්ති ප්‍රකාශනය**

**ආයුබෝවන්,**

මේ මිතුරු ළමා ගුවන්විදුලි සේවයයි.

**මුලින්ම සිරස්තල**

- වෙසක් සතිය නිමිත්තෙන් වැඩසටහන් රැසක්.
- ගස්වැල් රැකගැනීමට වන රක්ෂණ දෙපාර්තමේන්තුව මහජනතාවගේ සහය පතයි.

- ගෞතම බුදුරජාණන් වහන්සේගේ ඉපදීම, බුදුවීම හා පිරිනිවන්පෑම යන තෙමඟුල වෙනුවෙන් මෙවර දිවයිනේ බොහෝ පාසල් වල විවිධ වැඩ සටහන් පැවැත්වේ. ශීල සමාදන වැඩ සටහන්, දන්සල් භාවනා වැඩසටහන් ආදී ප්‍රතිපත්ති පූජා මෙන්ම වෙසක් සැරසිලි, තොරණ, වෙසක් නිර්මාණ තරග ආදී ආමිස පූජාද ඒ අතර වෙයි. මේ සඳහා සතියක වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපන අමාත්‍යංශය පාසල්වලට උපදෙස් දී ඇත.

- ගස්වැල් මිනිසාට මෙන්ම සතුන්ටද නැතුවම බැරි දෙයක්, ගස්වැල් රැකගැනීම අප කාගේත් වගකීමක් වන්නේ ඒ නිසයි. එහෙත් කලෙක සිට දැව ජාවාරම්කරුවන්ගෙන් ගස්වැල් ආරක්ෂා කර ගැනීම අසීරු කරුණක් වී තිබෙනවා. මෙලෙස ගස්වැල් කපා විනාශ කළොත් අනාගත පරම්පරාවට කාන්තාරයක ජීවත් වීමට සිදුවේ වි. මේ පිළිබඳ ඔබ සැමගේ අවධානය යොමු කර ගස්වැල් විනාශ කරන අය පිළිබඳ ඔබ දන්නා තොරතුරු කඩිනමින් වන රක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ අඩවි වන නිලධාරී කාර්යාලයට දන්වන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

**ප්‍රවෘත්ති සමාප්තයි.**

1. ප්‍රවෘත්ති ඉදිරිපත් කරන ගුවන් විදුලි සේවය කුමක් ද?

______________________________________________

2. ඉදිරිපත් කළ එක් සිරස්තලයක් ලියන්න.

______________________________________________

______________________________________________

3. තෙමඟුල යනු මොනවා ද?

______________________________________________

______________________________________________

4. වෙසක් සතියේ කිරීමට බලාපොරොත්තු වන දේවල් දෙකක් ලියන්න.

______________________________________________

______________________________________________

5. අපට නැතුව බැරි දෙයක් ප්‍රවෘත්තිවලින් කිය වේ. ඒ මොනවා ද?

______________________________________________

______________________________________________

6. ගස්වැල්වලට හානි කරන්නේ කවුරු ද?

______________________________________________

______________________________________________

**5. තේරවිලි කවි කියවන්න. තේරුම කොටුව තුළින් ගෙන ලියන්න.**

| යතුර, පනාව, කොකා, ඉදල, කරවිල |
|---|

තපස් රකිනවා
කෙතේ ඉන්නවා
මාළු සොයනවා
කියන්න මගේ නම ______________________

උඩහ ගෙදර මම යන කොට
අඟර දඟර වැලක් තිබුණා
මල් සුවඳයි ගෙඩි තිත්තයි
නොතේරුවොත් ටොකු විස්සයි ______________________

ගුලක් බලා රිංගනවා
ඒක ඇතුළේ කැරකෙනවා
ගේ දෙර බඩු රැක දෙනවා
තේරුවොතින් පඩි දෙනවා ______________________

දත් තිබුණත් කටක් නැතේ
සියලුම දත් උල් ව ඇත්තේ
අවුල් ලිහා හැඩ කරතේ
නැති ගෙදරත් ඇත්තේ නැතේ ______________________

පිරිසිදුකම කරන අගේ
රැවුළ ඉත්තෑ කුරු වගේ
මිදුල වටේ යන එන කොට
රැවුළ ඇදෙයි පොළොව දිගේ ______________________

**6. ඡේදය කියවන්න.**

අපි දිනපතා ප්‍රවෘත්ති බලන්න පුරුදු වන්න ඕනෑ. එතකොට අපිට විවිධ තොරතුරු දැන ගන්න පුළුවන්. රට තොට පුවත් දැන ගැනීම හරිම වටිනවා. රථ වාහන ගැන, වනය ගැන, ගංගා, ඇළ, දොළ, ගැන ගන්න අපට එතකොට පුළුවන්.

ලංකාව වටේටම මුහුද. අපේ රට ඇතුළේ මොන තරම් දේවල් තිබෙනවාද. ගංගා, ඇළ, දොළ, වනාන්තර, වගේම ඇස් අදහා ගත නොහැකි අලංකාර දිය ඇලිත් තිබෙනවා.

ඒ වගේම රෑ දවල් අපට සෙවණ සලසන ගස්වැල් කරන්නේ පුදුම සේවාවක්. ගස්වැල් සහිත වනය මෙන්ම ඇළ, දොළ, ගංගා, දිය ඇලි ආරක්ෂා කර ගැනීමට දිවා රාත්‍රී වෙහෙස වෙමු. එවිට අපටත් සතුටින් ජීවත් වීමට හැකි වේවි.

**සමානාර්ථ පද ඡේදයෙන් තෝරා ලියන්න.**

1. දිවයින - ______________________
2. නෙත් - ______________________
3. කැලෑව - ______________________
4. රිය - ______________________
5. ප්‍රවෘත්ති - ______________________

**7. නිවේදනය කියවා හිස් තැන්වලට සුදුසු වචන ලියන්න.**

අප පාසලේ ප්‍රාථමික දරුවන් වෙනුවෙන් ගිම්හාන නිවසක් ඉදිකිරීම සඳහා මුල් ගල තැබීමේ උත්සවය මැයි මස 20 බදදා පෙරවරු 8:00 ට ආරම්භ වේ. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා සහභාගි වෙයි. එදින උදේ 7:50 වන විට සියලුම දෙමාපියන් පාසලට පැමිණ ප්‍රධාන ශාලාවේ අසුන් ගත යුතු බව සංවිධාන කමිටුව දැනුම් දෙයි.

1. උත්සවය කුමක් වෙනුවෙන් ද?

   ______________________________________

2. ප්‍රධාන ආරාධිත අමුත්තා කවුරුන් ද?

   ______________________________________

3. උත්සවය පැවැත්වෙන දිනය ලියන්න.

   ______________________________________

4. උත්සවය ආරම්භ කරන වේලාව කුමක් ද?

   ______________________________________

5. දෙමාපියන් එදිනට අසුන් ගත යුත්තේ කොහේද?

   ______________________________________

6. "අසුන් ගන්නවා" යනු කුමක්ද?

   ______________________________________

**හිස්තැන් පුරවන්න.**

1. ප්‍රාථමික දරුවන් වෙනුවෙන් ______________________ ඉදි කිරිමට බලාපොරොත්තු වේ.
2. මුල්ගල තැබීමේ උත්සවය මැයි 20 ____________ පෙරවරු 8:00 ______________ වේ.
3. ______________________ ප්‍රධාන ශාලාවේ වාඩිවිය යුතුය.

**සමානාර්ථ පද ඡේදයෙන් සොයා ලියන්න.**

1. විදුහල - ______________________
2. උළෙල - ______________________
3. වාඩිවීම - ______________________

**විරුද්ධාර්ථ පද ඡේදයෙන් සොයා ලියන්න.**

1. අවසාන - ______________________
2. හවස - ______________________
3. පස්වරු - ______________________

**8. ඔබේ කියවීම පොතේ නිදහස් උත්සවය පාඩම හොඳින් කියවන්න. ප්‍රශ්නවලට වලට පිළිතුරු ලියන්න.**

1. අපේ රටට නිදහස ලැබුණේ, කුමන වර්ෂයක කවදා ද?

______________________________________________

2. නිදහස් දිනය ද කරන දෙයක් ලියන්න.

______________________________________________

3. නිදහස් උත්සවය පවත්වන්නේ ඇයි?

______________________________________________

______________________________________________

**9. ගැළපෙන වචනය රවුම තුළින් තෝරාගෙන හිස්තැන් මත ලියන්න.**

1. වැඩිහිටියන් සිටින තැන පහත් අසුනක හිඳ ගැනිමට ____________ විය යුතු ය.
2. අපට ______________ ඇඳුම් පැළඳුම් තෝරා ගත යුතු ය.
3. ඉතා හොඳින් ______________ වලට පිළිතුරු සැපයිය යුතු ය.
4. ප්‍රශ්නවලට ඉතා නිවැරදි ________________ තෝරා ගත යුතු ය.
5. පුස්තකාලයේ දී ________________ කතා කළ යුතු ය.
6. දෙමව්පියන්ට ______________ විම හොඳ දරුවෙකුගේ ලක්ෂණයකි.
7. ගුරුවරුන්ට __________________ දරුවා ශිල්ප ද හරියාකාරව ලබා නොගනියි.
8. අපට ________________ දේවල් ළං කර නොගත යුතුය.

9. දිවීමේ තරගයේ දී ________________ දුව ගියහොත් ජයගත හැකි ය.

10. ________________ කැමබීම අපට ලෙඩ ඇති කරයි.

| | | | |
|---|---|---|---|
| පුරුදු | අකීකරු | නොගැළපෙන | |
| නුපුරුදු | කීකරු | පිළිතුරු | ප්‍රශ්න |
| සෙමින් | ගැළපෙන | වේගයෙන් | |

**10. ඔබ කියවූ කතන්දර පොත් තුනක තොරතුරු පුරවන්න.**

කතන්දර පොතේ නම : - ________________

කතුවරයාගේ නම : - ________________

ඔබේ සිත්ගත් අවස්තාව : - ________________

________________

________________

________________

________________

කතන්දර පොතේ නම : - ________________

කතුවරයාගේ නම : - ________________

ඔබේ සිත්ගත් අවස්තාව : - ________________

________________

________________

________________

________________

කතන්දර පොතේ නම : - ________________

කතුවරයාගේ නම : - ________________

ඔබේ සිත්ගත් අවස්තාව : - ________________

________________

________________

________________

________________

**11. සුබ පැතුම් පත හොඳින් කියවන්න.**




1. මේ සුබ පැතුම් පත කුමක් සඳහා එවා ඇත් ද?

   ____________________________________________________

2. එය එවා ඇත්තේ කාට ද?

   ____________________________________________________

3. සුබ පැතුම් පත කවුරුන් විසින් එවා ඇත්ද?

   ____________________________________________________

**12. සිතුලගේ රචනය.**

"පුතා, හෙට රචනයක් ලියාගෙන යන්න ඕනෑ කිව්වා නේ ද? මෙන්න ඒකට හොඳ <u>ප්‍රවෘත්තියක්</u> පෙන්වනවා. එන්න බලන්න." සිතුලගේ තාත්තා සිතුලට කතා කළා. රූපවාහිනිය බලන තාත්තා අසලින් සිතුල වාඩි වුණා. <u>කැලෑව</u> තුළ සිදු වන අපූරු සිදුවීම් ඇතුළත් <u>පුවතක්</u> රූපවාහිනී තිරයේ දිස් වුණා. රචනය ලියන්න කියන්නේ <u>වනය</u> ගැන. "මේක බැලුවොත් නම් මට රචනය ලේසියෙන් ම ලියන්න පුළුවනි." සිතුල තාත්තාට කිව්වේ හරි ම සතුටින්.

රූපවාහිනී තිරයේ දිස් වූයේ අපේ මේ පුංචි <u>දිවයින</u> ආශ්‍රිත ව වැඩෙන ගස්, වැල් හා ජීවත් වන සතුන් පිළිබඳ ව යි. අපේ රට පුංචි <u>දූපතක්</u> වුණත්, මීට පෙර නොදුටු දර්ශන දුටු සිතුල <u>ඇස්</u> අදහා ගත නොහැකි ව බලා සිටියා. වර්ෂාව සහිත <u>රාත්‍රියට</u> සතුන් වනයේ ගත කරන දුක්බර ජීවිතය දුටු සිතුලගේ <u>නෙත්</u> කඳුලින් තෙත් වුණා. <u>රැය</u> සහ දවල් වෙනසක් නොමැති ව සතුන්ට වගේ ම අපටත් සෙවණ සහ ජලය දීමට උදවු කරන ගස්වැල් අපේ රටටම ආදර්ශයක් යැයි සිතුලට සිතුණා.

පැය භාගයක පමණ කාලයක් තුළ නැරඹූ දර්ශනයෙන් සිතුල රචනය ලිවීමට ඕනෑ කරන කරුණු රැස් කර ගත්තා. "තාත්තාට බොහොම ස්තුතිය. අමතක වීමට පෙර මම රචනය ලියන්න ඕනෑ" කියමින් සිතුල හුන් තැනින් නැගිට කාමරයට ගියා.

**මෙම සමානාර්ථ පද යුගල කියවන්න.**

| | | |
|---|---|---|
| ප්‍රවෘත්තියක් | - | පුවතක් |
| කැලෑව | - | වනය |
| දූපත | - | දිවයින |
| රාත්‍රිය | - | රැය |
| ඇස් | - | නෙත් |

## 13. වලස් පවුල

එකමත් එක කැලෑවක ගල් ගුහාවක වලස් පවුලක් ජීවත් වුණා. මේ වලස් අම්මටයි, තාත්තටයි දරුවන් දෙදෙනෙකු හිටියා. වලස් අයියා හරි ම කීකරු යි. ඒත් වලස් මල්ලී හරි ම අකීකරු යි. මේ දෙන්න ම ඉගෙන ගත්තේ කැලෑ ගමේ ඉස්කෝලෙ.

පාසලෙන් දෙන පාඩම්වල ප්‍රශ්නවලට වලස් අයියා නම් පිළිතුරු ලියාගෙන යනවා. ගුරුතුමී ඒවා අගය කරනවා. ඒත් මල්ලි නම් ප්‍රශ්නවලට පිළිතුරු ලියාගෙන එන්නේ ඕනෑවට එපාවට. ඒ නිසා ගුරුතුමී වලස් අම්මාට පණිවුඩයක් යැවුවා.

"වලස් අම්මේ, මේ ලොකු පුතා ලියාගෙන එන පිළිතුරු, ප්‍රශ්නවලට හොඳින් ගැළපෙනවා. ඒත් පොඩි පුතා පිළිතුරු නොගැළපෙන විදියට යි ලියන්නේ." මේ පිළිතුරු හොඳින් ලියන ආකාරය වලස් අම්මාට කියා දුන්නා. වලස් අම්මා එදා ගෙදර ගිහින් පොඩි පුතාට හොඳින් පිළිතුරු ලියන්න කියා දුන්නා. මේ අයියයි, මල්ලියි ඉස්කෝලේ ඇරිලා ගෙදර ගියා ම ගුහාව පිටුපස තියෙන ගඟට නාන්න යනවා. ගඟේ වතුර සෙමෙන් ගලා ගෙනයන තැනකින් නාන්න වලස් අම්මයි, තාත්තයි පුතාලට පුරුදු කරලා තියෙනවා. ඒත් එදා පොඩි පුතා වතුර වේගයෙන් ගලන තැනකින් නාන්න සිතුවා. පොඩි පුතා වතුරට ගහගෙන යනකොට වලස් අයියා අම්මටයි තාත්තටයි කෑ ගහලා කතා කළා. ඒ දෙන්නා ඇවිත් පුතා බේරා ගත්තා. "පුරුදු තැනින් නාන්නේ නැති ව නුපුරුදු තැනකින් නාන්න එපා" කියලා තත්තා පොඩි පුතාට අවවාද කළා. එදා ඉඳලා පොඩි වලස් පුතා හොඳ ළමයකු වුණා. වලස් අම්මයි, තාත්තයි පුතාගේ වෙනස් වීම අගය කළා. වලස් පවුලෙ හැම දෙනා ම හරිම සතුටෙන් කල් ගෙවුවා.



**කතාවේ ඇති විරුද්ධාර්ථ පද යුගල කියවන්න.**

| | | |
|---|---|---|
| කීකරු | - | අකීකරු |
| ප්‍රශ්න | - | පිළිතුරු |
| ගැළපෙන | - | නොගැළපෙන |
| සෙමින් | - | වේගයෙන් |
| පුරුදු | - | නුපුරුදු |

**ගැළපෙන වචන වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

1. ඉතා ____________________ දුවගෙන ගිය නිපුන් තරගයේ පළමුවැනියා විය.
   තරගයේ අන්තිමයා වූයේ ______________________ දුවගෙන ගිය තාරක ය. ( සෙමෙන්/ වේගයෙන්).
2. වලස් අයියා හරි ම ___________________________ යි.
   වලස් මල්ලී හරි ම ___________________________යි. ( කීකරු/ අකීකරු)
3. විභාගයට ________________________ දහයක් තිබිණි.
   ඒවාට __________________________ ලිවීම ඉතා පහසු විය. ( ප්‍රශ්න/ පිළිතුරු)
4. ____________________________ රූපයට වචන යා කරන්න.
   ____________________________ වචනය කපා හරින්න. (ගැළපෙන/ නොගැළපෙන)
5. වලස් අයියා ______________________________ තැනකින් නෑවේ ය.
   වලස් මල්ලී ______________________________ තැනකින් නෑවේ ය. (පුරුදු/ නුපුරුදු)